# පඬුඅබා

යක්ෂ ගෝත්‍රිකයන් මුළ දී නාග ගෝත්‍රිකයන් මෙන් ඉක්මණින් බුද්දදහම වැළඳ නොගැනීම හිතළුවක් නො වෙයි. සාතාගිර හේමවත නම් යක්ෂ ගෝත්‍රිකයන් දෙදෙනා බුද්දදහම හා බුදුන් වහන්සේ කෙරෙහි පැහැදීමෙන් පෙන්වන්නේ පෞද්ගලික ව ඔවුන් ඒ කෙරෙහි දැක් වූ ලැදිකමක් මිස පොදුවේ යක්ෂ ගෝත්‍රිකයන් බුද්දදහම කෙරෙහි දැක් වූ ආකල්පය නො වෙයි. දැනුම් පද්ධතීන් නිර්මාණය කිරතමේ දී අප පළමුව දැනගත යුත්තේ විශේෂය සාධාරණත්වයෙන් වෙන් කර හැඳින ගැනීම ය. විශේෂය සාධාරණත්වය ලෙස සැලකීමෙන් අපට දැනුම් පද්ධතියක් නිර්මාණය කළ නො හැකි ය.

ඇතැම්හු බොහෝ කරුණු දනිති. එහෙත් ඒ කරුණු අතර ඇති සම්න්ධය තේරුම් ගැනීමට ඔවුහු අසමත් වෙති. කරුණු (දත්ත) ඔස්සේ සාධාරණත්වය කුමක් දැයි දැනගැනීමට සියළු කරුණු හැදෑරිය යුතු නො වෙයි. දත්ත අතර ඇති සම්බන්ධ හා රටා තේරුම්ගැනීමට අවශ්‍යවන්නේ තාර්කික ඥානයක් නොව ප්‍රතිභාන (intuitive) ඥානයකි. ඇතැම්විට එයට අන්තර්ඥානයක් යැයි ද කියැවෙයි. ප්‍රතිභානයක් නොමැත්තා කෙතරම් කරුණු දැනගත්ත ද සාධාරණය කළ හැකි අවස්ථාවල ඒ සාධාරණයකිරීමට (generalize) නො දනියි.

දඹදිව ඇතැම් බ්‍රාහ්මණයෝ ද බුද්දදහම වැළඳ ගත්හ. සැරියුත් මුගලන් අග්‍රශ්‍රාවක වහන්සේ දෙනම උපතිස්ස කෝලිත නමින් වූ බ්‍රාහ්මණ තරුණයෝ දෙදෙනෙක් වූහ. එහෙත් එපමණින් අපි බ්‍රාහ්මණයන් පොදු වේ ගත්කල බුද්දදහමට ඇදී ආ බවක් නො කියමු. බ්‍රාහ්මණයන්ට පොදුවේ ගත්කල, එනම් සාධාරණීය වශයෙන්, බුද්දදහමට ආකර්ශනීය වීමට නො හැකි විය. ඒ ඔවුන්ගේ චින්තනය බුද්දදහමට අවශ්‍ය වූ චින්තනයට වඩා බෙහෙවින් වෙනස් වීම හේතුවෙනි.

යක්ෂ ගෝත්‍රිකයන් බ්‍රාහ්මණයන් තරමට ම බුද්දදහම නොපිළිගත්තේ යැයි අපි නො කියමු. එහෙත් ඔවුන් පොදුවේ ගත්කල බුද්දදහමට අකර්ෂණය වුයේ ඉතා මන්දගාමීව ය. මිහිඳු මහ රහතන් වහන්සේ වැඩම කර අවුරුදු දෙදහස් තුන්සියකට වැඩි කාලයක් ගෙවී ඇතත් තවමත් අනෙක් සිංහල බෞද්ධයන් මෙන් බුද්දදහම පිළිපැදීම ප්‍රතික්ෂේප කරන්නෝ යක්ෂ ගෝත්‍රිකයන්ගෙන් පැවත එන්නන් අතර වෙති. ඒ යක්ෂ ගෝත්‍රයට සතු ආවේණික ලක්ෂණයක් හේතුකොට ගෙන ය. ඔවහු තම චින්තනය වෙනස් කරගැනීමට එතරම් කැමැත්තක් නො දක්වති.

බුදුන් වහන්සේගේ මහියංගන යක්ෂ දමනය හා යක්ෂයන් ගිරි දිවයිනට පිටත් කෙළේ යැයි කියන කතාවලින් පෙන්නුම් කරන්නේ යක්ෂයන් හා බුද්දදහම අතර ආරම්භයේ දී යම් විරසකයක් තිබූ බව ය. මෙය කාලයත් සමග ක්‍රමයෙන් නැතිවන්නට ඇත. එහෙත් සාතාගිර හේමවත පුවතින් දැක්වෙන්නට වඩා සාධාරණත්වයක් මෙහි වෙයි. යක්ෂ ගෝත්‍රිකයන් එක්කෙනකුට දෙදෙනකුට නොව ඉතා විශාල පිරිසකට බුද්දදහමට ආකර්ශණීය භාවයක් නොතිබූ බව මේ කතාවලින් දැනගත හැකි ය. නාගයන් බුදුන් වහන්සේට මෙරටට වැඩම කරන ලෙස ආරාධනය කර ඇති නමුත් යක්ෂයන් බුදුන්වහන්සේට එවැනි ආරාධනයක් කර නොමැත.

නාගයන්ගේ චින්තනය වුද්දදහමට පටහැණි නො වෙයි. බුද්දදහම උපත ලැබුයේ ද වෛදික චින්තනය එතරම් ප්‍රචලිත නොවූ දඹදිව නැගෙනහිර හා ඊසාන දිග ප්‍රදේශවල ය. එහි නාග ගෝත්‍රිකයෝ වාසය කළහ. අද ද වසති. එහෙත් යක්ෂයන්ගේ චින්තනය වෙනත් ම චින්තනයක් විය. ඔවුහු තම චින්තනයෙන් බැහැර වූයේ එසේ නොකර බැරි අවස්ථාවක දී පමණ ය. එවැනි අවස්ථාවල ඔවුහු තම චින්තනය මදක් සංශෝධනය කරන්නට ඇත.

පොදුවේ ගත්කල යක්ෂයන් බුද්දදහම නොපිළිගත්ත ද, කලින් සඳහන් කළ ආකාරයට සාතාගිර හේමවත වැන්නෝ පෞද්ගලික ව බුදුන් වහන්සේ කෙරෙහි පැහැදුණ හ. එහෙත් ඉන් කියැවන්නේ සාධාරණ වශයෙන් ගත්කල යක්ෂයන් බුද්දදහම පිළිගත්තේ ය යන්න නො වේ. බෞද්ධ සාහිත්‍යයෙහි සාමාන්‍ය වශයෙන් ගත්කල යක්ෂයන් ගැන සඳහන්වන්නේ එතරම් යහපත් ආකාරයකට නො වෙයි. එයට හේතුවන්නට ඇත්තේ යක්ෂයන් බුද්දදහම පිළිගැනීමට දැක් වූ විරුද්ධත්වය යැයි අපට සාධාරණය (generalize) කළ හැකි ය.

© Prof. Nalin De Silva

බ්‍රාහ්මණයන් හැරුණු කොට බුද්ධදහම පිළිගැනීමෙහි ලා විරුද්ධත්වයක් දැක්වූ පිරිසක් වෙත් නම් ඒ යක්ෂයෝ ය. යක්ෂ ගෝත්‍රිකයන් පැවිදි වූ අවස්ථා බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් තැන් විරල වේ යැයි සිතමි. බ්‍රාහ්මණ වාංශිකයන් තරමටවත් යක්ෂ ගෝත්‍රිකයන් පැවිදි වී නැතැයි අනුමාන කළ හැකි ය. මෙහි දී බ්‍රාහ්මණයන් හා යක්ෂයන් කොපමණ එදවස දැඹිදිව සිටියේ ද යන්න දැනගැනීමට තිබුණි නම් අපට වඩාත් පැහැදිලි චිත්‍රයක් මවාගැනීමට හැකිවීමට තිබුණි.

අප සාකච්ඡා කරමින් සිටින්නේ ඉතිහාසයේ සංකීර්ණ ක්‍රියාදාමයකි. භාරතයෙන් බුද්ධදහම නැතිවෙත් දී ලංකාවේ බුද්ධදහම පැවතුණේ කෙසේ ද? මෙරට ඉතිහාසය සකස් වී ඇත්තේ කෙසේ ද? සිංහල ජාතියේ සම්භවය කුමක් ද ආදී ප්‍රශ්න රාශියකට සංගත පිළිතුරු දීමේ අවශ්‍යතාව අපට ඇත. එහි දී යක්ෂ ගෝත්‍රිකයන් යනු කවු ද, ඔවුන්ගේ චින්තනය කෙබඳු වී ද  පඬුඅබා (අබා නො වේ. අබා යනු හීබ්‍රෑ භාෂාවෙන් පියා යැයි කියැවෙයි. සිංහලයෙන් බිය නැති හෝ බිය නැතිකළ යන අරුත වෙයි. එහෙත් පඬුඅබා ට ඉතිහාසයේ පසුගිය සියවස් විසිහතරක පමණ කාලයක් මුළුල්ලෙහි අබා යැයි කියැවී නැත.) යනු කවු ද? පඬුඅබා සිංහල ජාතියේ නිර්මාතෘ යැයි අප කියන්නේ ඇයි? ඔහු ඇතැමුන් කියන පරිදි සිංහ වාංශිකයන් ඝාතනය කෙළේ ද? එසේත් නැත්නම් සිංහ වාංශික පිරිස් ද එකතුකරගනිමින් සිංහල ජාතිය නිර්මාණය කෙළේ ද?

මේ ආදී ප්‍රශ්නවලට එක් පිළිතුරක් තවත් පිළිතුරක් සමග අසංගත (පරස්පර) නොවන අයුරින් පිළිතුරු දීමට අප උත්සාහ ගත යුතු ය. අප දැනට දී ඇති පිළිතුරු සංගත යැයි අපි සිතමු. යක්ෂ  ගෝත්‍රිකයන් ගැන හැදෑරීම මෙහි දී ඉතාමත් වැදගත් වෙයි. ඔවුහු කොහේ සිට පැමිණියෝ ද? ඔවුන්ගේ චින්තනය කුමක් වී ද? අද වන තුරුත් යක්ෂ ගෝත්‍රිකයන්ගෙන් පැවත එන්නන් යැයි කිවහැකි පිරිස් සාමාන්‍ය සිංහල බෞද්ධයන් මෙන් බුද්ධදහම පිළිපැදීමක් නොකරන්නේ ඇයි?

යක්ෂ නාග මෙන් ම අර්ධ වෛදිකයන් ආදීන් ද එකතුකරගනිමින් පඬුඅබා නිර්මාණය කළ සිංහල ජාතියට ඇතුළත් වූ නාගයන් ගැන ඉන්පසු එතරම් කරුණු අප සාහිත්‍යයෙහි සඳහන් නො වෙයි. නාගයන් මුළුමනින් ම සිංහල වී යැයි අපට සිතාගත හැකි ය. එහෙත් යක්ෂයෝ එසේ නොවෙති. සිංහල ජාතියට ඇතුළත් වීමෙන් පසුවත් ඔවුන්ට සිංහල ජාතිය සමග ප්‍රශ්න තිබූ බව ඉතිහාසයෙන් පෙනී යයි. ගැමුණු රජුගේ කාලයේ දී ද ඇතැම් යක්ෂයකුට ප්‍රශ්න තිබූ බව පැහැදිලි ය. එහෙත් දඹදෙණි යුගය වන විට මේ ප්‍රශ්න විසඳී යක්ෂයන් පූර්ණ වශයෙන් ම සිංහල ජාතිය සමග බැඳී ඇතැයි සිතිය හැකි ය.

සිංහල ජාතියේ සම්භවය අද අපට වැදගත් වන්නේ අදත් අප ජාතිය ගොඩනැගීම නොව වර්ධනය කිරීම පිළිබඳ ප්‍රශ්නයට මැදිහත් වී සිටින බැවින් ය. ජාතිය වර්ධනය කිරීමේ දී අපට පඬුඅබා වැදගත්වන්නේ ඇයි? මා තේරුම්ගන්නා ආකාරයට පඬුඅබා කිසිම ජනකොටසක් ලානය (ඝාතනය) කෙළේ නැත. ඔහු කෙළේ සියළු ජන කොටස් එකතුකිරීම මිස එක් ජනකොටසක් හෝ කිහිපයක් හෝ නැතිකිරීම නො වේ. ඔහු අපේ කලාපයට අළුත්ම රාජ්‍ය ක්‍රමයක් ස්ථාවර ව පවත්වාගෙන යෑමට කියා දුන්නේ ය.

ඒ අන් කිසිවක් නොව එක්සේසත් රාජ්‍යයි. භාරතයෙහි ද එක්සේසත් රාජ්‍ය සංකල්පය නොතිබුණා නො වේ. එහෙත් එහි ඒ රාජ්‍ය සංකල්පය විධිමත්ව ක්‍රියාත්මක නො වී ය. භාරතයෙහි වූ විවිධත්වය හේතුවෙන් එක්සේසත් රාජ්‍යයක් ක්‍රියාත්මක කළ හැකිව තිබුණේ බලය යෙදීමෙනි. පඬුඅබා බෞද්ධයකු නොවූ බව පැහැදිලි ය. එහෙත් ඔහු බුද්ධදහම හා බුදුන්වහන්සේ ගැන දැන සිටි බව නිසැක ය. ඔහුගේ මවගේ මව වූ භද්දකච්චනා කුමරිය ශාක්‍ය වාංශික කුමාරිකාවක් වූවා ය. විඩූඩභ රජු විසින් ශාක්‍යයන් ඝාතනය කිරීමෙන් පසුව පාණ්ඩ්‍ය දේශයට පැනගත් ශාක්‍ය වාංශිකයන්ගෙන් පැවත ආ කුමරියක වූ ඇය ලංකාවට පැමිණ ඇත්තේ පරිබ්‍රාජිකාවක සේ වෙස්වෙළාගෙන ය.

ඉන් කියැවෙන්නේ පරිබ්‍රාජිකාවන් මෙරටට ආගන්තුක නොවූ බව ය. ඒ මේ කලාපයේ සම්ප්‍රදායට අයත් විය. ඒ අර්ධ වෛදිකයන්ගේ සම්ප්‍රදාය නො වී ය. කාන්තාවනට සමාජයේ තැනක් නොදුන් බ්‍රාහ්මණයන් පරිබ්‍රාජිකා සම්ප්‍රදායකට ඉඩක් දේ යැයි සිතිය නො හැකි ය. ඒ කෙසේ වෙතත් භද්දකච්චනා කුමරියගේ පැමිණීමෙන් පසුව පඬුවස්දෙව් රජු ඇය මෙහෙසිය කරගත්තේ ය. ඉන් පසු ඇගේ සහෝදරයෝ ද ලංකාවට පැමිණියෝ ය. දීඝායු කුමරා ඉන් එක් අයෙකි. පඬුවස්දෙව් රජු දීඝායු කුමරා දීඝවාපියට යැවී ය.

© Prof. Nalin De Silva

පණ්ඩුවාසුදේව රජුට හා භද්දකච්චානා දේවියට පුතුන් දස දෙනකු හා දියණියක ලැබුණි. වැඩිමහල් පුතා අභය වූ අතර දියණිය චිත්‍රා විය. රූමත් ඇය උන්මාදචිත්‍රා නමින් ප්‍රසිද්ධ විය. අර්ධ වෛදික නැකැත්කරුවෝ ඇයට පුතකු ලැබෙන බවටත් ඔහු මාමාවරුන් මරා රජකම ගන්නා බවටත් අනාවැකි පළ කළෝ ය. මේ අනාවැකිය හේතුවෙන් ඇගේ සොහොයුරෝ පියරජු ලවා ඇය එක්ටැම් ගෙයක රැඳවූහ. මෙතැනට එන තෙක් මහාවංශයෙහි සඳහන් කතාව බොහෝ දෙනා පිළිගනිති. අනාවැකිය ගැන සඳහන් නොකළ ද දීපවංශය ද මෙහි දී මහාවංශය සමග විරුද්ධ නොවෙයි. මහාවංශයට අවුරුදු සියයකට පමණ කලින් ලියැවී ඇති දීපවංශය සංක්ෂිප්ත ය. දීපවංශය එක්කෝ සංක්ෂිප්තව ලියැවී ඇත. එසේත් නැතහොත් ඒ ලිවීමෙන් පසු ජනප්‍රවාදයට එක්වූ කතා රාශියකි. සමස්තයක් ලෙස ගත්කල මහාවංශයට එක් වූ ජනප්‍රවාද  හේතුවෙන් පඬුඅබා කතාවෙහි, එනම් ප්‍රවාදයෙහි අර්ථකථන, අර්ථනිරූපණ වෙනස්වන්නේ චිත්‍රා කුමරිය එක්ටැමෙහි  ජීවත්වීම ඇරඹීමෙන් පසුව ය.

අපි ඒ වෙනස්කම් පසුව සාකච්ඡා කරමු. දැනට කිවයුතු ප්‍රධානම කරුණ වන්නේ මහාවංශයෙහි, දීපවංශයෙහි හෝ මහාවංශ අටුවාවෙහි හෝ පඬුඅබා පිළිබඳ අබා නමින් හැඳින්වීමක් නොකෙරෙන බව ය. එහෙත් කතාව, එනම් ප්‍රවාදය ඒ ඒ කාලයට අවශ්‍ය අන්දමට සකස් වී ඇති බව එහි ඇති වෙනස්කම් වලින් පැහැදිලි ය. අද  පඬුඅබා යන්න අබා ලෙස වෙනස්වන්නේ නම් එයට හේතුව එවැනි වෙනසක් යම් පිරිසකට අවශ්‍ය වීම ය. එය දේශපාලන හා සංස්කෘතික අවශ්‍යතාවකි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva